# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 03 - 2019 පෙබරවාරි

## ඉදිරි වගා කන්නය දුඹුරු පැළ කීඩෑවාගෙන් නිදහස් වීමට නම්..........



ගොයමට විනකරන පළිබෝධකයින් ගැන කතා කරද්දී මෑත කාලයේදී වැඩිපුරම අවධානය යොමුවූයේ දුඹුරු පැල කීඩෑවාට යයි කීවොත් නිවැරදිය. මෙහි විශේෂත්වය වන්නේ පෙරදී වසර හත අටකට වරක් වාර්තා වූ මෙම හානිය දැන් කන්නයක් පාසා දක්නට ලැබීමයි. කලකට පෙර 1997-98 මාස් කන්නයේදී මෙය වසංගතයක් ලෙස හිස එසවූ පසු යලි ආවේ 2009-10 මහ කන්නයේදීය. එනම් වසර දහයකටත් පසුවයි. ඊළඟට දරුණු තත්වයක් ඇතිවූයේ තවත් හත් වසරකට පසු 2017-18 මාස් කන්නයේදීය. අස්වාභාවික තත්වය ඇතිවූයේ ඉන් පසුවයි. අනුපිලිවෙලට පැමිණෙන ඊළඟ වගා කන්න දෙක වන 2018 යල හා 2018-19 මහ තුළදී ද සැලකිය යුතු හානියක් සිදුකරමින් දුඹුරු පැල කීඩෑවා කෙත ආක්‍රමණය කරන ලදි.




බොහොමයක් ගොවීන් දුඹුරු පැල කීඩෑවාගේ හානිය හඳුනා ගන්නේ කීඩෑ පිළිස්සුම වශයෙන් දක්නට ලැබෙන මැරීගිය ගොයම් සමූහයන් ලියද්දේ තැන තැන පෙනෙන්නට පටන් ගන්නා විටය. මේ වනවිට ගොයමට සිදුවිය යුතු ආර්ථික හානිය සිදුව ඇති බැවින් හඳුනාගෙන ප්‍රතිකාරය කළ යුත්තේ මීට කලකට පෙර බව පළමුව ගොවි ජනතාව තේරුම් ගතයුතු කරුණකි. වගා ස්ථාපනයට අදාළ මූලික කාර්යයන් ඉටුකළ පසු, දිනපතා කුඹුර දකිනවා මිස, ගොවියා ලියැද්දට බැස, කුඹුර බලන්නට කටයුතු නොකරන නිසා මේ ව්‍යසනය කල් ඇතිව හඳුනාගැනීමට නොහැකි වී තිබේ.




වසර කීපයකට පෙර අත්දැකීම් ගැන සඳහන් කරන්නේ නම්, දුඹුරු පැල කීඩැවාගේ හානිය සුලභව දක්නට ලැබුනේ පීදීමට ආසන්න හා පීදීමට පසු ගොයමේය. එහෙත් දැන් දැන් එකලඟ කන්න වලදී හානිය පැමිණීමත් සමග මාසයක් පමණ වයසේ වූ ගොයමේ සිටම වසංගතය දක්නට ලැබේ.

පැල මැක්කාගේ හානිය ද දැන් පෙරට වඩා වැඩිනිසා එය මැඩලීමට ළපටි ගොයමට ගොවීන් වැඩි වැඩියෙන් පළිබෝධනාශක යොදනු ලබයි.

මේ නිසා ආරම්භයේදීම කුඹුරේ පරිසර සමතුලිතතාවය නැතිවී කීඩැවාගේ ස්වභාවික සතුරන් වැනසී ගොස්, කීඩැවාට හිස එසවීමට පහසුවෙන තත්වයක් උදාවෙන බව විද්වත් මතය වේ.

පරිසරයට බරක් නොවන ආකාරයට, ඉතා අවම පළිබෝධනාශක භාවිතයකින් දුඹුරු පැල කීඩැවා කළමනාකරණය කළ හැකි අතර ඒ සඳහා පහත දැක්වෙන කරුණු පිළිබඳව අවධානය යොමුකිරීම ගොවි මහතාගේ වගකීමක් වේ.

- කීඩැවන් සඳහා වඩාත් ප්‍රතිරෝධී, ප්‍රදේශයට හා කන්නයට උචිත වී ප්‍රභේද තෝරා ගැනීම ගැන සැලකිලිමත් වන්න.
- වී වගාව සඳහා නිර්දේශ කර ඇති බීජ ප්‍රමාණය පමණක් වපුරන්න. වැඩි බීජ ඝනත්වයක් යෙදුවහොත්, ගොයම් ගස් වැඩිපුර ළංවීම නිසා පළිබෝධකයාට හිතකර ක්ෂුද්‍ර පරිසරයක් නිර්මාණය වේ. මන්දයත් ගොයමේ පාදීය පෙදෙසට අඩුවෙන් හිරුඑළිය හා වාතාශ්‍රය ලැබෙන බැවිනි.
- කුඹුරේ අනවශ්‍ය ලෙස ජලය නොතිබිය යුතුයි. වැඩි වතුර හැකි සෑම විටකදීම ඉවත් කරන්න. කුඹුර යනු සෑම දිනම ජලය තිබිය යුතු ස්ථානයක් නොවේ. මේ නිසාද දුඹුරු පැල කීඩැවාට උචිත ක්ෂුද්‍ර පරිසරයක් සෑදේ.
- බිම් සැකසීම සඳහා නියම කාලය ගත කරන්න. එහිදී නියර වලත්, අවට පරිසරයේත් වල් මර්දනය නියමාකාරයෙන් කල යුතුයි. නිසි වල් මර්දනයක් නොවුනා යනු පළිබෝධකයින්ට වාසස්ථාන සැපයීමකි.
- නයිට්‍රජනීය පොහොර භාවිතය නිර්දේශිත ආකාරයට සිදු කරන්න. යූරියා වැනි පොහොර වැඩිපුර භාවිතා කිරීමෙන් ගොයම් ශාකය මෘදුවන අතර. පළිබෝධ ආසාදනයන්ට පහසුවෙන් ගොදුරුවීමේ අවදානමක් ද පවතී.
- ගොවියා විසින් පළිබෝධකයා සිටින බව හඳුනා ගැනීම වගාවේ මුල් අවධියේදීම කළ යුතුය. මේ සඳහා සුපරික්ෂාකාරීවීම අත්‍යාවශ්‍ය වේ.
- කුඹුරු යායේම ගොවීන් එකමුතුව වගා කාලසටහන සාදා ගැනීම වැදගත්ය. යායම එකවිට, එකම වයස් කාණ්ඩයේ වී වර්ග වවන්නේ නම් එහි ක්ෂුද්‍ර පරිසරයේ විෂමතාවයක් ඇති නොවේ. ඒ නිසා පළිබෝධ මර්දනය පහසුය.

- කන්නයට අනුගතව වගා ස්ථාපනය කළ යුතුය. මේ අනුව පෙරදී මුළු රට පුරා මාසයක් පමණ ඇතුලත සියලු කුඹුරු වගා කර අවසන් වුවත්, දැන් එය මාස තුනක පමණ කාලයක් දක්වා දික්වී තිබේ. මේ නිසා පර්යටන හැකියාවක් ඇති කීඩෑවන් වැනි සතුන් එක පලාතක් හැරදමා, අලුතින් ගොයම් සිටුවන පෙදෙස් කරා සංක්‍රමණය වේ.
- පරිසර තත්වයන් කීඩෑවන් සඳහා හිතකර අවස්ථාවලදී වසංගත තත්වයක් දක්වා යාම වළක්වාගැනීම සඳහා නිර්දේශිත කෘමිනාශක භාවිතා කිරීමට සිදුවේ. මෙතනදී පළමුව සොයා බැලිය යුත්තේ සිටින්නේ කුමන කීඩෑවා ද යන්නයි. පිට සුදු පැල කීඩෑවා ද සිටිය හැකි අතර මේ දෙදෙනාම දුඹුරු පැහැ සතුන් වුවත්, පිට සුදු වර්ගයේ කුඩා සුදු ඉරක් පිටෙහි පිහිටා ඇත. දැනට ඇති කීඩෑ ගහණ ඝනත්වය හා ඉදිරියේ ඇතිවිය හැකි කාලගුණික තත්වය ද සලකා පළිබෝධනාශක තෝරාගැනීම කළයුතු වේ.
- කෘමිනාශක යොදන්නේ නම් නියම ප්‍රමාණයට යෙදිය යුතුය. හානිය ඇති තැන් සොයමින් අක්කරයකට ලීටර් 16 ටැංකි 4-8 ක ප්‍රමාණය යෙදීම ඵලක් නැත. එසේම කෘමිනාශක, ගොයමේ පාදීය ප්‍රදේශයට ලැබෙන සේ යෙදිය යුතුය. ඒ කීඩෑවන් සිටින්නේ පාදීය කොටසේ බැවිනි. වසංගත මට්ටමේ කීඩෑ උවදුරක් ඇත්නම් ටැංකි 12-15 ක් පමණ අවශ්‍ය වනු ඇත.
- වැඩිපුර වගාවේ සිටින්නේ සුහුඹුලා ද, ශිෂුවා ද යන වග, ගොයම් ගසේ වයස ආදිය ද පළිබෝධනාශක තෝරා ගැනීමේ වැදගත්ය.
- ගොයමේ පාදස්ථයට කෘමිනාශක ළඟාවෙන පරිදි ගොයම අඩි 1 $^{1}/_{2}$ - 2 පමණ පරතරය ඇතිව තීරු වලට බෙදාගෙන, ශාකයේ හැම කොටසකටම ලැබෙන පරිද්දෙන් දෙපසින් කෘමිනාශක යෙදිය යුතුවේ.

දුඹුරු පැල කීඩෑවා හිස ඔසවන වගා කන්නයකින් ගොවියා නිදහස් වීමට නම්, පළිබෝධ කළමනාකරණයේ මෙම මූලධර්ම ඔහු අනුගමනය කල යුතු වේ. අනවශ්‍ය පළිබෝධනාශක වලින් බැහැර වීම හරහා නිෂ්පාදන පිරිවැය අවම කිරීමට ද, වසවිස නැති යහගුණැති සහලක් නිපදවීමට ද හැකි බව තේරුම් ගැනීමට දැන් කාලය එළඹ තිබේ.

**පිටපත ඃ** සනත් එම්. බණ්ඩාර, සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ, ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය

**තාක්‍ෂණික කරුණු ඃ** එස්.ආර්. සරත්චන්ද්‍ර, සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ (පර්යේෂණ), එස්.ඒ.පී.පී. සෙනරත්, පර්යේෂණ සහකාර

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ

පරිගණක නිර්මාණය ඃ ගෝතමී ලියනගේ

අධීක්‍ෂණය හා උපදෙස් ඃ එස්. පෙරියසාමි (අධ්‍යක්‍ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ)